www.AlevelApi.com

# රසායන විද්‍යාව

## ලකුණු දීමේ පටිපාටිය - 2013



Visit EDUHUB
අපේ පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

## A කොටස - ව්‍යුහගත රචනා

ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න. (එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය 10 කි.)

(a) වරහන් තුළ දී ඇති ගුණය වැඩි වන පිළිවෙලට පහත සඳහන් දෑ සකසන්න. හේතු අවශ්‍ය නොවේ.

(i) $CO$, $CO_2$, $CO_3^{2-}$ (C—O බන්ධන දුර)

$CO$ < $CO_2$ < $CO_3^{2-}$

(ii) $NO_2^+$, $NO_3^-$, $NH_3$ (N පරමාණුවෙහි විද්‍යුත් සෘණතාව)

$NH_3$ < $NO_3^-$ < $NO_2^+$

(iii) $BeSO_4$, $MgSO_4$, $CaSO_4$ (වියෝජන උෂ්ණත්වය, $MSO_4 \longrightarrow MO + SO_3$, M = ලෝහය)

$BeSO_4$ < $MgSO_4$ < $CaSO_4$

(iv) Ne, Ar, Kr (ඝනත්වය)

Ne < Ar < Kr

(v) S, F, Si, Cl (පරමාණුක අරය)

F < Cl < S < Si (05 x 5)

1 (a) ලකුණු 25

(b) නයිට්‍රමයිඩ් ($H_2N—NO_2$) දුබල අම්ලයකි. භස්මයක් හමුවේ දී එය $N_2O$ සහ $H_2O$ බවට වියෝජනය වේ. නයිට්‍රමයිඩ් මත පදනම් වී ඇති (i) සිට (v) කොටස්වලට පිළිතුරු සපයන්න. එහි සැකිල්ල පහත දී ඇත.



(i) මෙම අණුව සඳහා වඩාත්ම පිළිගත හැකි ලුවිස් ව්‍යුහය අඳින්න.

A



(10)

(ii) මෙම අණුව සඳහා සම්ප්‍රයුක්ත ව්‍යුහ අඳින්න. හේතු දක්වමින්, ඒවායේ ස්ථායිතා පිළිබඳ අදහස් දක්වන්න.




A ස්ථායී (01)
එක ළඟ පරමාණු මත විරුද්ධ ආරෝපණ ඇත (01). වඩා විද්‍යුත් සෘණ මූලද්‍රව්‍ය මත සෘණ ආරෝපණයක් ඇත (01)

B ස්ථායී (01)
එක ළඟ පරමාණු මත විරුද්ධ ආරෝපණ ඇත (01). වඩා විද්‍යුත් සෘණ මූලද්‍රව්‍ය මත සෘණ ආරෝපණයක් ඇත (01)

C අස්ථායී (01)
එක ළඟ පරමාණු මත එක ආරෝපණ දෙකක් ඇත. (02)

සටහන : සම්ප්‍රයුක්තතාවය පෙන්නුම් කරන ඊතල ලියා නොමැති නම් ඒ සඳහා (01) බැගින් අඩු කරන්න.
1(b)(ii) සඳහා අවම ලකුණ ශුන්‍ය වේ.

(iii) පහත දී ඇති වගුවෙහි දක්වා ඇති

I. පරමාණු වටා ඇති ඉලෙක්ට්‍රෝන යුගල ජ්‍යාමිතිය (ඉලෙක්ට්‍රෝන යුගලවල සැකසුම)

II. පරමාණු වටා ඇති හැඩය

III. පරමාණුවල මුහුම්කරණය

සඳහන් කරන්න.

| | H පරමාණු දෙකට බැඳුණු N | O පරමාණු දෙකට බැඳුණු N | |
|---|---|---|---|
| I. ඉලෙක්ට්‍රෝන යුගල ජ්‍යාමිතිය | චතුස්තලීය | තලීය ත්‍රිකෝණාකාර | (03+0 |
| II. හැඩය | පිරමිඩීය | තලීය ත්‍රිකෝණාකාර | (03+0 |
| II. මුහුම්කරණය | $sp^3$ | $sp^2$ | (03+( |

(iv) මෙම අණුව ධ්‍රැවීය ද නැතහොත් නිර්ධ්‍රැවීය ද? ධ්‍රැවීය (04)



අපොස උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.
Visit EDUHUB

(v) ඉහත (i) කොටසෙහි අඳින ලද ලුවිස් ව්‍යුහයෙහි පහත දක්වා ඇති බන්ධන සෑදීම සඳහා යොදාගනු ලබන පරමාණුක / මුහුම් කාක්ෂික හඳුනා ගන්න. පහත දක්වෙන පරිදි N පරමාණු 1 සහ 2 ලෙස නම් කර ඇත.



I. $N^1$ සහ $N^2$ ........ $sp^3$ (මුහුම් කාක්ෂික) + $sp^2$ (මුහුම් කාක්ෂික) ........ (03 + 03)

II. $N^1$ සහ H ........ $sp^3$ (මුහුම් කාක්ෂික) + $1s$ (පරමාණුක කාක්ෂික) ........ (03 + 03)

සටහන : කාක්ෂික වර්ගය සඳහන් කිරීම අවශ්‍ය නැත. H සඳහා 1s ලෙස සඳහන් කර ඇත්නම් ලකුණු පිළිගත යුතු

1 (b) ලකුණු [illegible]

(c) Xe, $CH_3Cl$, HF

ඉහත දක්වා ඇති ද්‍රව්‍ය අතුරින්, කුමන එක / ඒවාට, පහත දක්වා ඇති බල තිබේ ද?

(i) ද්විධ්‍රැව-ද්විධ්‍රැව බල ........ $CH_3Cl$, HF ........ (02 + 02)

(ii) හයිඩ්‍රජන් බන්ධන බල ........ HF ........ (02)

(iii) ලන්ඩන් අපකිරණ බල ........ Xe, $CH_3Cl$, HF (ඕනෑම අනුපිළිවෙලකට) ........ (02 + 01 + 01)

1 (c) ලකුණු 10

2. (a) A මූලද්‍රව්‍යය s-ගොනුවට අයත් වේ. එහි පළමු අයනීකරණ ශක්තිය කාණ්ඩයේ වැඩි ම වේ. ජලය සමග A ප්‍රතික්‍රියා කර B වායුව මුදා හරියි. මෙම ප්‍රතික්‍රියාවේ දී සෑදෙන ද්‍රාවණය බන්සන් දැල්ලට රතු පැහැයක් ලබා දෙන අතර වාෂ්ප කිරීමේ දී ලෝහ ඔක්සයිඩය ලබා දෙයි. $N_2(g)$ සමග A ප්‍රතික්‍රියා කර C සංයෝගය ලබා දෙයි. A, $H_2(g)$ සමග ප්‍රතික්‍රියාවේ දී ලවණ-ආකාර හයිඩ්‍රයිඩ D සංයෝගය ලබා දෙයි. ජලය සමග පිරියම් (treat) කළ විට C රතු ලිට්මස් නිල් පැහැ ගන්වන E වායුවක් ලබා දෙයි.

(i) රසායනික සූත්‍ර දෙමින් A, B, C, D සහ E හඳුනාගන්න.

* A = Li B = $H_2$ C = $Li_3N$ D = LiH E = $NH_3$

(03 x 5)

(ii) ඉහත විස්තර කර ඇති ප්‍රතික්‍රියා සඳහා තුලිත රසායනික සමීකරණ දෙන්න.

$2Li + 2H_2O \longrightarrow 2LiOH + H_2$

$2LiOH \xrightarrow{\Delta} Li_2O + H_2O$

$6Li + N_2 \longrightarrow 2Li_3N$

$2Li + H_2 \longrightarrow 2LiH$

$Li_3N + 3H_2O \longrightarrow 3LiOH + NH_3$

(05 x 5)

2 (a) ලකුණු 40

* සටහන : 2(a)(i) හි A සඳහා පිළිතුර වැරදි නම් B, C, D, E සඳහා ද ලකුණු නොදෙනු ලැබේ

②

Visit EDUHUB

සියලුම විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

(E) පහත දැක්වෙන ප්‍රශ්න V සහ Cr නම් සංක්‍රාන්ති ලෝහ සහ ඒවායේ සංයෝග මත පදනම් වී ඇත.

(i) V හි භූමි අවස්ථාවේ ඉලෙක්ට්‍රෝන වින්‍යාසය දෙන්න. $1s^2 2s^2 2p^6 3s^2 3p^6 3d^3 4s^2$ හෝ $1s^2 2s^2 2p^6 3s^2 3p^6 4s^2 3d^3$ (05)

(ii) V හි ධන ඔක්සිකරණ අවස්ථා සඳහන් කරන්න. +2, +3, +4, +5 හෝ +II, +III, +IV, +V

හෝ 2, 3, 4, 5 හෝ II, III, IV, V (02 x 4)

(iii) ඉහත (ii) හි සඳහන් ධන ඔක්සිකරණ අවස්ථාවල දී V සාදන ඔක්සයිඩවල රසායනික සූත්‍ර දෙන්න. මෙම එක් එක් ඔක්සයිඩය ආම්ලික ද, උභයගුණී ද, භාෂ්මික ද යන වග දක්වන්න.

$VO$ – භාෂ්මික

$V_2O_3$ – භාෂ්මික

$VO_2$ – උභයගුණී

$V_2O_5$ – ආම්ලික (උභයගුණී) (02 x 8)

(iv) V මගින් සාදන ඔක්සොකැටායන දෙකක රසායනික සූත්‍ර දෙන්න. ආම්ලික ජලීය මාධ්‍යයේ දී ඒවායෙහි වර්ණ සඳහන් කරන්න.

$VO_2^+$ – කහ  $VO^+$ – Green (rain)

$VO^{2+}$ – නිල්  $VO^{+3}$ — Red (01 x 4)

(v) ජලීය ද්‍රාවණයක දී ක්‍රෝමියම් මගින් සාදනු ලබන සරලම අයනය කුමක් ද? එහි වර්ණය සඳහන් කරන්න. මෙම අයනයෙහි ජලීය ද්‍රාවණයකට ඝන $Na_2CO_3$ එක් කළ විට, ඔබ නිරීක්ෂණය කිරීමට බලාපොරොත්තු වන්නේ කුමක් දැයි පුරෝකථනය කරන්න.

$[Cr(H_2O)_6]^{3+}$ - දම්/ නිල් දම් හෝ $Cr^{3+}(aq)$ හෝ $Cr^{3+}$ - කොළ (04 + 04)

$CO_2$ මුක්ත වේ හෝ බුබුලු නිකුත්වේ හෝ කොළ අවක්ෂේපයක් (04)

සටහන : විශේෂය වැරදි නම් වර්ණය සඳහා ලකුණු නොලැබේ.

(vi) V ලෝහයෙහි එක් ප්‍රයෝජනයක් දෙන්න.

වානේහි මිශ්‍ර ලෝහයක් ලෙස හෝ මිශ්‍ර ලෝහවල හෝ උත්ප්‍රේරකයක් ලෙස ($V_2O_5$ පිළිගත හැක.) (04)

(vii) $CrCl_3$ හි කොළ පැහැති ජලීය ද්‍රාවණයකට පහත සඳහන් දෑ සිදු කළ විට ඔබට නිරීක්ෂණය කළ හැක්කේ කුමක් ද?

I. තනුක NaOH බිංදු කිහිපයක් එක් කළ විට

කොළ පැහැති අවක්ෂේපයක් (03)

II. වැඩිපුර තනුක NaOH සහ ඉන්පසු $H_2O_2$ එක් වර රත් කළ විට

කහ පැහැති ද්‍රාවණයක් (03)

(viii) සාන්ද්‍ර $K_2Cr_2O_7$ ද්‍රාවණයක් සාන්ද්‍ර $H_2SO_4$ සමඟ පිරියම් (treat) කළ විට ක්‍රෝමියම්හි දීප්තිමත් රතු ආම්ලික ඔක්සයිඩය X අවක්ෂේප වේ. X රත් කිරීමේ දී, කොළ පැහැති උභයගුණී ඔක්සයිඩය, Y ලැබේ. $(NH_4)_2Cr_2O_7$ රත් කළ විට ද, Y ලබා ගත හැකි ය.

X සහ Y හි රසායනික සූත්‍ර දෙන්න.

X = $CrO_3$  Y = $Cr_2O_3$ (03 + 03)

(ix) $K_2Cr_2O_7$ ද්‍රාවණයකට තනුක NaOH එක් කළ විට ඔබට කුමක් නිරීක්ෂණය කළ හැකි ද?

ද්‍රාවණය කහ පැහැති වේ හෝ තැඹිලි පැහැති ද්‍රාවණය කහ පැහැයට හැරේ. (03)

(x) අනුමාපන සඳහා $K_2Cr_2O_7$ භාවිත කිරීමේ දී ලැබෙන එක් වාසියක් සහ එක් අවාසියක් දෙන්න.

වාසිය - ප්‍රාථමික ප්‍රාමාණිකයකි හෝ ක්ලෝරයිඩ් අයන හමුවේ අනුමාපනය කළ හැක. (03)

අවාසිය - අන්ත ලක්ෂ්‍යයේදී වර්ණ විපර්යාසය නිරීක්ෂණය කිරීමට අපහසුවේ. හෝ එය ස්වයං දර්ශකයක් (self - indicator) නොවේ. (03)

2 (b) ලකුණු 70

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.
Visit EDUHUB

3. $M^{2+}(aq)$ ලෝහ අයනය $M^{3+}(aq)$ බවට ඔක්සිකරණය කිරීම සඳහා ක්ලෝරීන් වායුව ඔක්සිකාරකයක් ලෙස යොදා ගනී. පහත දත්ත සපයා ඇත.

| ප්‍රතික්‍රියාව | 25 °C හිදී සම්මත එන්තැල්පි වෙනස $\Delta H^\circ$ (kJ mol$^{-1}$) |
|---|---|
| $M(s) \longrightarrow M^{+}(aq) + e$ | − 31.5 |
| $M(s) \longrightarrow M^{2+}(aq) + 2e$ | − 48.5 |
| $M(s) \longrightarrow M^{3+}(aq) + 3e$ | − 82.5 |
| $Cl_2(g) + 2e \longrightarrow 2Cl^-(aq)$ | −334.0 |

$E^\circ_{M^{3+}/M^{2+}} = +0.77\ V \qquad E^\circ_{Cl_2/Cl^-} = +1.36\ V$

ඉහත ඔක්සිකරණය විද්‍යුත් රසායනිකව සිදු කරනු ලැබේ.

(i) ඔක්සිකරණ හා ඔක්සිහරණ ක්‍රියාවලි සඳහා අර්ධ ප්‍රතික්‍රියා ලියා දක්වා සමස්ත ප්‍රතික්‍රියාව [illegible] කරන්න.

ඔක්සිකරණ ප්‍රතික්‍රියාව : $M^{2+}(aq) \rightarrow M^{3+}(aq) + e$ (05)

ඔක්සිහරණ ප්‍රතික්‍රියාව : $Cl_2(g) + 2e \rightarrow 2Cl^-(aq)$ (05)

සමස්ත ප්‍රතික්‍රියාව : $2M^{2+}(aq) + Cl_2(g) \rightarrow 2M^{3+}(aq) + 2Cl^-(aq)$ (05)

(ii) ඉහත ප්‍රතික්‍රියාවෙහි $E^\circ_{cell}$ අගය මැනීම සඳහා අවශ්‍ය පරීක්ෂණාත්මක ඇටවුම පහත රූපයෙහි දක්වා ඇත. අදාළ අවස්ථාවල දී භෞතික අවස්ථාව, සාන්ද්‍රණය / පීඩනය සඳහන් කරමින් A සිට E දක්වා නම් කරන්න.




A : $Cl_2$(g, 1 atm) B : ලවණ සේතුව C : වෝල්ට්මීටරය (විභවමානය)

D : $Cl^-$(aq, 1.0 mol dm$^{-3}$) E : $M^{2+}$(aq, 1.0 mol dm$^{-3}$) and $M^{3+}$(aq, 1.0 mol dm$^{-3}$) මිශ්‍රණය

(05 × 5 = 25)

(iii) ඉහත කෝෂය සඳහා $E^\circ_{cell}$ ගණනය කරන්න.

$E^\circ_{Cell} = E^\circ_{Cl_2/Cl^-} - E^\circ_{M^{3+}/M^{2+}}$ හෝ $E^\circ_{Cell} = E^\circ_{cathode} - E^\circ_{anode}$ හෝ $E^\circ_{Cell} = E^\circ_{RHS} - E^\circ_{LHS}$ (05)

හෝ $1.36V - 0.77V$

$= 0.59V$ (04 + 01)

(iv) (i) කොටසෙහි දී දැක්වූ සමස්ත ප්‍රතික්‍රියාව සඳහා 25 °C හිදී සම්මත එන්තැල්පි වෙනස ($\Delta H^\circ$) ගණනය කරන්න.




සටහන : [illegible] (eq ÷ 1) [illegible] (18 + 03) [illegible]

$\Delta H^0 = 2 \times (-82.5\ kJ\ mol^{-1}) - 2 \times (-48.5\ kJ\ mol^{-1}) + (-334.0\ kJ\ mol^{-1})$

$\Delta H^0 = -402\ kJ\ mol^{-1}$ (03+01)

(3)

Visit EDUHUB
Aevel Api සියලුම විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

$\Delta G^{\circ} = -k E^{\circ}_{cell}$ මගින් දෙනු ලැබේ.

මෙහි $k = 1.93 \times 10^5 \, J \, mol^{-1} V^{-1}$ වේ.

ඉහත කෝෂ ප්‍රතික්‍රියාව සඳහා, 25 °C හිදී සම්මත ගිබ්ස් ශක්ති වෙනස ($\Delta G^{\circ}$) ගණනය කරන්න.

$\Delta G^{\circ} = -k E^{\circ}_{cell}$

$-1.93 \times 10^5 (J\,mol^{-1}\,V^{-1}) \times 0.59\,(V)$ (04 +01)

$-113.87\,kJ\,mol^{-1}$ (04 +01)

(vi) ඉහත කෝෂ ප්‍රතික්‍රියාව සඳහා, 25 °C හිදී සම්මත එන්ට්‍රොපි වෙනස ($\Delta S^{\circ}$) ගණනය කරන්න.

$\Delta G^{0} = \Delta H^{0} - T\Delta S^{0}$ (සමීකරණ ලියා දක්වා නැත්නම් ලකුණු නොලැබේ.) (05)

$-113.87\,(kJ\,mol^{-1}) = -402\,(kJ\,mol^{-1}) - 298\,(K)\,\Delta S^{0}$ (04 +01)

$\Delta S^{0} = 288\,kJ\,mol^{-1}/(-298\,K)$

$\Delta S^{0} = -0.97\,kJ\,mol^{-1}\,K^{-1}$ (04 +01)

4. (a) (i) A සංයෝගය ප්‍රකාශ සමාවයවිකතාවය පෙන්නුම් කරන අතර එහි අණුක සූත්‍රය $C_7H_{16}$ වේ.

I. පහත දී ඇති කොටු තුළ A වලට තිබිය හැකි එකිනෙකට ප්‍රතිරූප අවයව නොවන ව්‍යුහ දෙකක් අඳින්න.







(10 +10)

II. ඔබ අඳින ලද ව්‍යුහ දෙක අතර සමාවයවික සම්බන්ධතාවය සඳහන් කරන්න.

ව්‍යුහ සමාවයවික හෝ Constitutional සමාවයවික හෝ දාම සමාවයවික ........ (05)

(ii) B හා C යනු ප්‍රකාශ අක්‍රිය, අණුක සූත්‍රය $C_7H_{14}$ වන සංයෝග වේ. B හා C යන දෙක ම ජ්‍යාමිතික සමාවයවිකතාවය පෙන්වයි. B හා C එකිනෙකෙහි ජ්‍යාමිතික සමාවයවික නොවේ. B හෝ C හි උත්ප්‍රේරක හයිඩ්‍රජනීකරණයෙන් එක ම A සංයෝගය ලැබේ.

I. A, B හා C වල ව්‍යුහයන් පහත සඳහන් කොටු තුළ අඳින්න. (ත්‍රිමාන සමාවයවික ආකාර ඇඳ දැක්වීම අවශ්‍ය නැත.)




A




B




C

(10 + 10 + 10)

II. B හා C වල IUPAC නාම ලියන්න.

B : 3-methyl-2-hexene / 3-methylhex-2-ene (01)

C : 3-methyl-3-hexene (01)

සටහන : B හා C හුවමාරු කර තිබිය හැක. එවිට එකිනෙකට අදාළ නිවැරදි IUPAC නාමය ලිවිය යුතුයි.

4 (a) ... 55

ඔබත් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.
Visit EDUHUB

www.AlevelApi.com



(b) පහත සඳහන් ප්‍රතික්‍රියා අනුපිළිවෙළ සලකන්න.

$$CH_2{=}CH{-}CH_2Br \xrightarrow[\text{ප්‍රතික්‍රියාව 1}]{HBr} P \xrightarrow[\text{ප්‍රතික්‍රියාව 2}]{\text{මද්‍යසාරීය KOH}} Q \xrightarrow[\text{ද්‍රව } NH_3]{NaNH_2} R \xrightarrow{CH_3CH_2Br} S$$

ප්‍රතික්‍රියාව 3    ප්‍රතික්‍රියාව 4

(i) P, Q, R හා S වල ව්‍යුහයන් පහත සඳහන් කොටුවල අඳින්න.

| P | Q |
|---|---|
| $CH_3{-}CH(Br){-}CH_2Br$ | $CH_3C{\equiv}CH$ |

| R | S |
|---|---|
| $CH_3C{\equiv}C^- Na^+$ හෝ $CH_3C{\equiv}CNa$ | 3 for all<br>$CH_3C{\equiv}C{-}CH_2CH_3$<br>සටහන : පිළිතුර වැරදි වුවත් කොටුව හිස් වුවත් S සඳහා සම්පූර්ණ ලකුණු (03) ප්‍රදානය කරන්න |

(03 × 4)

(ii) $A_N$, $A_E$, $S_N$, $S_E$, E, AB ලෙස අදාළ කොටුවෙහි ලියමින් ඉහත ප්‍රතික්‍රියා අනුපිළිවෙලෙහි ... ප්‍රතික්‍රියාව නියුක්ලියෝෆිලික ආකලන ($A_N$), ඉලෙක්ට්‍රොෆිලික ආකලන ($A_E$), නියුක්ලියෝෆිලික ආදේශ ($S_N$), ඉලෙක්ට්‍රොෆිලික ආදේශ ($S_E$), ඉවත් වීම (E) හෝ අම්ල භෂ්ම (AB) ලෙස වර්ගීකරණය කරන්න.

| ප්‍රතික්‍රියාව | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|
| ප්‍රතික්‍රියා වර්ගය | $A_E$ | E | AB | $S_N$ |

සටහන : පිළිතුර වැරදි වුවත් කොටුව හිස් වුවත් 4 කොටුව සඳහා සම්පූර්ණ ලකුණු (03) ප්‍රදානය කරන්න

(03 × 4)

(iii) ප්‍රතික්‍රියාව 1 සඳහා යාන්ත්‍රණය ලියන්න.




(12)

විකල්ප පිළිතුර

$HBr \longrightarrow H^{\oplus} + Br^{\ominus}$ (03)




4



සියලුම ජීව/භෞතික/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

(b) T ද්‍රාවණය පිළියෙළ කර ඇත්තේ $FeC_2O_4$ 0.300 g, තනුක $H_2SO_4$ හි ද්‍රාවණය කිරීමෙනි. ද්‍රාවණය 65 °C දක්වා රත් කරන ලදී. මෙම තත්ත්ව යටතේ දී, $FeC_2O_4$ සමඟ සම්පූර්ණයෙන්ම ප්‍රතික්‍රියා කිරීම සඳහා අවශ්‍ය 0.025 mol $dm^{-3}$ $KMnO_4$ ද්‍රාවණයේ පරිමාව ගණනය කරන්න.
(C = 12, O = 16, Fe = 56)

සැ.යු.: T ද්‍රාවණයේ දී $FeC_2O_4$, $Fe^{2+}$ සහ $C_2O_4^{2-}$ ලෙස පවතී යයි සලකන්න.

1 <u>ක්‍රමය</u>

සිදුවන අර්ධ ප්‍රතික්‍රියා

$5(Fe^{2+} \rightarrow Fe^{3+} + e)$ (02)

$5(C_2O_4^{2-} \rightarrow 2CO_2 + 2e)$ (02)

$3\,(MnO_4^- + 8H^+ + 5e \rightarrow Mn^{2+} + 4H_2O)$ (02,

$3MnO_4^- + 5C_2O_4^{2-} + 5Fe^{2+} + 24H^+ \rightarrow 5Fe^{3+} + 10CO_2 + 12H_2O + 3Mn^{2+}$ (08,

$FeC_2O_4$ මවුලයක ස්කන්ධය = 144 g

$FeC_2O_4$ හි මවුල ප්‍රමාණය $= \dfrac{0.300\ g}{144\ g}$ (03,

$Fe^{2+}$ හි මවුල ප්‍රමාණය = $C_2O_4^{2-}$ හි මවුල ප්‍රමාණය $= \dfrac{0.300\ g}{144\ g} = 2.08 \times 10^{-3}$ (03

$KMnO_4$ හි පරිමාව $V$ $cm^3$ ලෙස සැලකීමෙන්

$MnO_4^-$ හි මවුල ප්‍රමාණය $= \dfrac{0.025}{1000} \times V$ (0

එබැවින්, $Fe^{2+}$ හි මවුල ප්‍රමාණය = $C_2O_4^{2-}$ හි මවුල ප්‍රමාණය $= \dfrac{0.025}{1000} \times V \times \dfrac{5}{3}$

(03 + 03 + 03

$\dfrac{0.025}{1000} \times V \times \dfrac{5}{3} = 2.08 \times 10^{-3}$ (0

$V = 50.0\ cm^3$ (04 + 0



Visit EDUHUB
අපේ පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

## විකල්ප පිළිතුරු

1(b)(i) මෙම අණුව සඳහා වඩාත්ම පිළිගත හැකි ලුවිස් ව්‍යුහය අඳින්න.

A



(10)

(ii) මෙම අණුව සඳහා සම්ප්‍රයුක්ත ව්‍යුහ අඳින්න. හේතු දක්වමින්, ඒවායේ ස්ථායිතා පිළිබඳ [illegible] දක්වන්න.

A, B, හා C ව්‍යුහ පහත දී ඇති අන්දමට ද නිරූපණය කළ හැක.

A



(04)

B



(04)

C



(04)

3(iv)

$M(s) \rightarrow M^{2+}(aq) + 2e \quad \Delta H^{\circ} = -48.5\ kJ\ mol^{-1}$ ---(1) (01)

$M(s) \rightarrow M^{3+}(aq) + 3e \quad \Delta H^{\circ} = -82.5\ kJ\ mol^{-1}$ ---(2) (01)

$Cl_2(g) + 2e \rightarrow 2Cl^-(aq) \quad \Delta H^{\circ} = -334.0\ kJ\ mol^{-1}$ ---(3) (01)

$2M^{2+}(aq) + Cl_2(g) \rightarrow 2M^{3+}(aq) + 2Cl^-(aq)$ (02)

$\Delta H^0 = 2 \times (2) - 2 \times (1) + (3)$

$\Delta H^0 = 2 \times (-82.5\ kJ\ mol^{-1}) - 2 \times (-48.5\ kJ\ mol^{-1}) + (-334.0\ kJ\ mol^{-1})$

*(04 + 01)* *(04 + 01)* *(04 + 01)*

$\Delta H^0 = -402\ kJ\ mol^{-1}$ (03 + 01)

සටහන : ප්‍රතික්‍රියා දක්වා නැති නමුත් ගණනය නිවැරදි නම් ඉහත ලකුණු (06) [illegible] නය කරන්න.

5

සියලු පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.
Visit EDUHUB




(02)

(01)

(01)

(02)

සියලුම එන්තැල්පි වෙනස y-අක්ෂය මත හෝ ශක්ති මට්ටම් යා කරන ඊතල මත ඊතක සමග දැක්වීම හෝ

$\Delta H^\circ = 2\times(-82.5\ kJ\ mol^{-1}) - 2\times(-48.5\ kJ\ mol^{-1}) + (-334.0\ kJ\ mol^{-1})$

*(04 + 01)* *(04 + 01)* *(04 + 01)*

$\Delta H^\circ = -402\ kJ\ mol^{-1}$ *(03 + 01)*

සටහන : **එන්තැල්පි සටහන** දක්වා නොමැති වුවද ගණනය නිවැරදිව කර ඇතිනම් එන්තැල්පි සටහන සඳහා වෙන්කළ ලකුණු (06) ගණනය සඳහා ප්‍රදානය කරන්න.

www.alevelapi.com

අපේ පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත . Visit EDUHUB

www.AlevelApi.com



## B කොටස - රචනා

5. (a) A හා B යනු වාෂ්පශීලී හා සම්පූර්ණයෙන් මිශ්‍ර වන ද්‍රව දෙකක් වන අතර ඒවා මිශ්‍ර කළ විට පරිපූර්ණ ද්‍රාවණයක් සෑදෙයි. A ද්‍රවයෙන් 1.0 mol හා B ද්‍රවයෙන් 1.0 mol අඩංගු මිශ්‍රණයක් සංවෘත බඳුනක තබන ලදී. මෙම පද්ධතිය සමතුලිතතාවයට එළැඹි විට වාෂ්ප කලාපයේ පීඩනය, පරිමාව සහ මෙම කලාපයේ A/B මවුල අනුපාතය පිළිවෙළින් $1.0\times10^3$ Pa, 0.8314 $m^3$ හා 2/3 බව සොයා ගන්නා ලදී. පද්ධතිය 200 K හි පවතින බව සලකා පහත සඳහන් දෑ ගණනය කරන්න.

(i) වාෂ්ප කලාපයේ ඇති මුළු මවුල ප්‍රමාණය.

$PV = nRT$ යෙදීමෙන්

$$n = \frac{PV}{RT}$$

$$n = \frac{1.0\times10^3\ Pa \times 0.8314\ m^3}{8.314\ J\ mol^{-1}\ K^{-1} \times 200\ K} \qquad (04 + 01)$$

$$n = 0.5\ mol \qquad (04 + 01)$$

*5(a)(i) සඳහා ලකුණු 10*

(ii) ද්‍රව කලාපයේ A හා B වල මවුල භාග.

වාෂ්ප කලාපයේ A වල මවුල ගණන = $n_A$, වාෂ්ප කලාපයේ B වල මවුල ගණන = $n_B$

වාෂ්ප කලාපයේ A වල මවුල භාගය = $X_A$, වාෂ්ප කලාපයේ B වල මවුල භාගය = $X_B$.

ද්‍රව කලාපයේ A වල මවුල භාගය = $X'_A$, ද්‍රව කලාපයේ B වල මවුල භාගය = $X'_B$

$$\frac{X_A}{X_B} = \frac{n_A}{n_B} = \frac{2}{3} \qquad (03)$$

$$n = n_A + n_B = 0.5 \qquad (03)$$

$$n_A = 0.2\ mol \qquad (01 + 01)$$

$$n_B = 0.3\ mol \qquad (01 + 01)$$

ද්‍රව කලාපයේ ඉතිරි වන A ප්‍රමාණය = (1.0-0.2)mol = 0.8 mol (01 + 01)

ද්‍රව කලාපයේ ඉතිරි වන B ප්‍රමාණය = (1.0-0.3)mol = 0.7 mol (01 + 01)

$$X'_A = \frac{0.8\ mol}{(0.8+0.7)\ mol} = \frac{8}{15} = 0.533 \qquad (03)$$

$$X'_B = \frac{0.7\ mol}{(0.8+0.7)\ mol} = \frac{7}{15} = 0.467 \qquad (03)$$

(පියවර එකතු කර ඇති නම් ඒ අනුව ලකුණු ප්‍රදානය කරන්න)

*5(a)(ii) සඳහා ලකුණු 30*



අපේ පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.
Visit EDUHUB

(iii) **A හා B වල සංතෘප්ත වාෂ්ප පීඩනයන්.**

A වල ආංශික පීඩනය = $P_A$, B වල ආංශික පීඩනය = $P_B$; A වල සංතෘප්ත වාෂ්ප පීඩනය = $P^0_A$, B වල සංතෘප්ත වාෂ්ප පීඩනය = $P^0_B$

ඩෝල්ටන් නියමය යෙදීමෙන්,

$$P_A = P \times X_A = 1.0 \times 10^3 \text{ Pa} \frac{0.2 \text{ mol}}{0.5 \text{ mol}} \qquad (02)$$

$$P_A = 4.0 \times 10^2 \ Pa \qquad (01)$$

එපරිදිම

$$P_B = P \times X_B = 1.0 \times 10^3 \text{ Pa} \frac{0.3 \text{ mol}}{0.5 \text{ mol}} \qquad (02)$$

$$P_B = 6.0 \times 10^2 \ Pa \qquad (01)$$

රාවුල් නියමය යෙදීමෙන්,

$$p^0_A = \frac{P_A}{X_A} = \frac{4.0 \times 10^2 \ Pa}{8/15} \qquad (03 + 01)$$

$$= 7.5 \times 10^2 \ Pa \qquad (02 + 01)$$

$$p^0_B = \frac{P_B}{X_B} = \frac{6.0 \times 10^2 \ Pa}{7/15} \qquad (03 + 01)$$

$$= 1.286 \times 10^3 \ Pa \qquad (02 + 01)$$

5(a)(iii) සඳහා ලකුණු 20

5 (a) සඳහා මුළු ලකුණු = 50

www.alevelapi.com



Visit EDUHUB

සියලු පොදු විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

(b) සංතෘප්ත $Mn(OH)_2$ ද්‍රාවණයක 25 °C හිදී $Mn^{2+}$ සාන්ද්‍රණය $1.0\times10^{-5}$ mol dm$^{-3}$ වේ. 25 °C හිදී $Mg(OH)_2$ හි ද්‍රාව්‍යතා ගුණිතය $1.0\times10^{-10}$ mol$^{3}$ dm$^{-9}$ වේ. 25 °C හිදී $NH_4OH$ හි $K_b$ අගය $1.6\times10^{-5}$ mol dm$^{-1}$ වේ.

(i) 25 °C හිදී $Mn(OH)_2$ හි ද්‍රාව්‍යතා ගුණිතය ගණනය කරන්න.

25 °C දී $Mn(OH)_2$ වල ද්‍රාව්‍යතාවය = $1.0 \times 10^{-5}$ mol dm$^{-3}$

$Mn(OH)_2(s) \rightleftharpoons Mn^{2+}(aq) + 2OH^-(aq)$ (භෞතික අවස්ථාවන් අත්‍යවශ්‍යයි) (02)

$K_{sp} = [Mn^{2+}(aq)][OH^-(aq)]^2$ (භෞතික අවස්ථාවන් අත්‍යවශ්‍යයි) (02)

$K_{sp} = 1x10^{-5}\ mol\ dm^{-3}\ x(2x10^{-5}\ mol\ dm^{-3})^2$ (02 + 01)

$K_{sp} = 4x10^{-15}\ mol^3\ dm^{-9}$ (02 + 01)

5(b)(i) සඳහා ලකුණු 10

(ii) 25 °C හිදී සාන්ද්‍රණය 0.01 mol dm$^{-3}$ වූ $NH_4OH$ ද්‍රාවණයක හයිඩ්‍රොක්සයිඩ් අයන සාන්ද්‍රණය ගණනය කරන්න.

$NH_4OH(aq) \rightleftharpoons NH_4^+(aq) + OH^-(aq)$ (භෞතික අවස්ථාවන් අත්‍යවශ්‍යයි) (01)

$$K_b = \frac{[NH_4^+(aq)][OH^-(aq)]}{[NH_4OH(aq)]}$$ (භෞතික අවස්ථාවන් අත්‍යවශ්‍යයි) (01)

$NH_4OH$ දුර්වල භෂ්මයක් බැවින් විඝටන ප්‍රමාණය ඉතා කුඩාය.

$[NH_4^+(aq)] = [OH^-(aq)]$ සහ $[NH_4OH] = 0.01$ mol dm$^{-3}$ (02)

$$1.6\times10^{-5}\ mol\ dm^{-3} = \frac{[OH^-(aq)]^2\ (\text{mol dm}^{-3})^2}{0.01\ \text{mol dm}^{-3}}$$ (02 + 01)

$[OH^-(aq)] = 4.0\times10^{-4}$ mol dm$^{-3}$ (02 + 01)

5(b)(ii) සඳහා ලකුණු 10

(iii) සාන්ද්‍රණය 0.001 mol dm$^{-3}$ වූ $MnSO_4$ ද්‍රාවණයකින් $Mn(OH)_2$ අවක්ෂේප වීම පටන් ගැනීම සඳහා අවශ්‍ය $NH_4OH$ සාන්ද්‍රණය නිර්ණය කරන්න.

$K_{sp} = [Mn^{2+}(aq)][OH^-(aq)]^2$

$4\times10^{-15}(mol^3\ dm^{-9}) = 10^{-3}(mol\ dm^{-3})\times[OH^-(aq)]^2$

$$[OH^-(aq)]^2 = \frac{4\times10^{-15}(mol^3\ dm^{-9})}{10^{-3}(mol\ dm^{-3})} = 4\times10^{-12}(mol\ dm^{-3})^2$$ (04 + 01)

$[OH^-(aq)] = 2\times10^{-6}\ mol\ dm^{-3}$ (04 + 01)

$Mn(OH)_2$ අවක්ෂේප වීම ආරම්භ වීම සඳහා අවශ්‍ය $[OH^-(aq)] = 2\times10^{-6}$ mol dm$^{-3}$

$[OH^-(aq)]$, $2x10^{-6}$ mol dm$^{-3}$ වීම සඳහා අවශ්‍ය වන $[NH_4OH]$ = x ලෙස උපකල්පනය කිරීමෙන්,



Visit EDUHUB විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

$$NH_4OH(aq) \rightleftharpoons NH_4^+(aq) + OH^-(aq)$$

$x - 2\times10^{-6}$ mol dm$^{-3}$ $\quad$ $2\times10^{-6}$ mol dm$^{-3}$ $\quad$ $2\times10^{-6}$ mol dm$^{-3}$

$$1.6\times10^{-5}\ mol\ dm^{-3} = \frac{[2\times10^{-6}]^2\ (\text{mol dm}^{-3})^2}{x - 2\times10^{-6}\ mol\ dm^{-3}} \qquad (04 + 01)$$

$$x = 2.25\times10^{-6}\ \text{mol dm}^{-3} \qquad (04 + 01)$$

හෝ

$$1.6\times10^{-5}\ mol\ dm^{-3} = \frac{[2\times10^{-6}]^2\ (\text{mol dm}^{-3})^2}{x} \qquad (04 + 01)$$

$$x = 2.5\times10^{-7}\ \text{mol dm}^{-3} \qquad (04 + 01)$$

← if get dissociation is very Small, then get this answer.

5(b)(iii) සඳහා ලකුණු 20

(iv) සාන්ද්‍රණය 1.00 mol dm$^{-3}$ වූ $NH_4OH$ ද්‍රාවණයක 1.00 dm$^3$ පරිමාවක් තුළ $NH_4Cl$ 5.35 g දිය කර ඇත්නම් එම ද්‍රාවණයෙහි හයිඩ්‍රොක්සයිඩ් අයන සාන්ද්‍රණය ගණනය කරන්න.
(H = 1.0, N = 14.0, Cl = 35.5)

$NH_4Cl$ වල අණුක ස්කන්ධය = 14.0 + 1.0 x 4 + 35.5 = 53.5 g mol$^{-1}$

එමනිසා $NH_4Cl$ ප්‍රමාණය = 5.35 g/ 53.5 g mol$^{-1}$ = 0.1 mol $\qquad$ (01 + 01)

ජලීය මාධ්‍යයකදී $NH_4Cl$ සම්පූර්ණයෙන් විඝටනය වන බැවින්

$[NH_4^+(aq)]$ = 0.1 mol dm$^{-3}$ $\qquad$ (01 + 01)

$[NH_4OH]$ = c mol dm$^{-3}$ ලෙස හා විඝටන ප්‍රමාණය $\alpha$ ගත් විට

$$NH_4OH(aq) \rightleftharpoons NH_4^+(aq) + OH^-(aq)$$

at equlibrium

$c(1-\alpha)$ mol dm$^{-3}$ $\quad$ $c\alpha$ mol dm$^{-3}$ $\quad$ $c\alpha$ mol dm$^{-3}$

$[NH_4^+(aq)] = (0.1 + c\alpha)$ mol dm$^{-3}$ = 0.1 mol dm$^{-3}$ $\qquad$ (03 + 01)

$[NH_4OH(aq)] = (1.0 - c\alpha)$ mol dm$^{-3}$ = 1.0 mol dm$^{-3}$ $\qquad$ (03 + 01)

සටහන : වගන්ති ලෙස ලියා ඇත්නම් ලකුණු (04) + (04) ප්‍රදානය කරන්න.

$$1.6\times10^{-5}\ mol\ dm^{-3} = \frac{0.1\ mol\ dm^{-3}[OH^-(aq)]\ \text{mol dm}^{-3}}{1.0\ \text{mol dm}^{-3}} \qquad (03 + 01)$$

$$[OH^-(aq)] = 1.6\times10^{-4}\ \text{mol dm}^{-3} \qquad (03 + 01)$$



Visit EDUHUB විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

$NH_4Cl$ වල අණුක ස්කන්ධය = 14.0 + 1.0 x 4 + 35.5 = 53.5 g $mol^{-1}$

එමනිසා $NH_4Cl$ ප්‍රමාණය = 5.35 g/ 53.5 g $mol^{-1}$ = 0.1 mol (01 + 01)

ජලීය මාධ්‍යයකදී $NH_4Cl$ සම්පූර්ණයෙන් විඝටනය වන බැවින්

$[NH_4^+(aq)] = 0.1\ mol\ dm^{-3}$ (01 + 01)

$[NH_4^+(aq)] = (0.1+c\alpha)\ mol\ dm^{-3} = 0.1\ mol\ dm^{-3}$ (02 + 01)

$[NH_4OH(aq)] = (1.0-c\alpha)\ mol\ dm^{-3} = 1.0\ mol\ dm^{-3}$ (02 + 01)

සටහන : වගන්ති ලෙස ලියා ඇත්නම් ලකුණු *(04)* + *(04)* ප්‍රදානය කරන්න

$$pOH = pK_b + \log\left(\frac{[salt]}{[base]}\right)$$

$$pOH = -\log(1.6\times10^{-5}) + \log\left(\frac{[0.1\ mol\ dm^{-3}]}{[1.0\ mol\ dm^{-3}]}\right)$$ (02 + 01)

$$pOH = 3.796$$

$$[OH^-] = 1.6\times10^{-4}\ mol\ dm^{-3}$$ (02 + 01)

*5(b)(iv)* සඳහා ලකුණු 20

(v) 0.02 mol $dm^{-3}$ $Mg(NO_3)_2$ ද්‍රාවණයක 0.50 $dm^3$ හා 0.20 mol $dm^{-3}$ $NH_4OH$ ද්‍රාවණයක 0.50 $dm^3$ මිශ්‍ර කිරීමෙන් සෑදීමට යන ද්‍රාවණයක $Mg(OH)_2$ අවක්ෂේප වීම වැළැක්වීම සඳහා අවශ්‍ය වන ... මවුල සංඛ්‍යාව ගණනය කරන්න.

අවසාන ද්‍රාවණයේ $[Mg(NO_3)_2(aq)]$

$$= \frac{0.02\ mol\ dm^{-3}\times0.50\ dm^3}{1.0\ dm^3} = 0.01\ mol\ dm^{-3}$$ (04 + 01)

$Mg(NO_3)_2$, $Mg^{2+}$ සහ $NO_3^-$ අයන වලට සම්පූර්ණයෙන් විඝටනය වන බැවින්

අවසාන ද්‍රාවණයේ $[Mg^{2+}(aq)] = 0.01\ mol\ dm^{-3}$

අවසාන ද්‍රාවණයේ $Mg(OH)_2(s)$ අවක්ෂේප වීම වැළැක්වීම සඳහා,

$$K_{sp} \geq [Mg^{2+}(aq)][OH^-(aq)]^2$$

$$1\times10^{-10}(mol^3\ dm^{-9}) \geq 10^{-2}(mol\ dm^{-3})\times[OH^-(aq)]^2$$

$$[OH^-(aq)]^2 \leq \frac{1\times10^{-10}(mol^3\ dm^{-9})}{10^{-2}(mol\ dm^{-3})} = 1\times10^{-8}(mol\ dm^{-3})^2$$ (04 + 01)

$$[OH^-(aq)] \leq 1\times10^{-4}\ mol\ dm^{-3}$$ (04 + 01)



විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

අවසාන ද්‍රාවණයේ [$NH_4OH(aq)$]

$$= \frac{0.20\ mol\ dm^{-3} \times 0.50\ dm^3}{1.0\ dm^3} = 0.10\ mol\ dm^{-3}$$ (04 + 01)

[$OH^-(aq)$], $1\times10^{-4}$ mol $dm^{-3}$ ලෙස පවත්වා ගැනීම සඳහා අවශ්‍ය [$NH_4Cl(aq)$]= x ලෙස ගත් විට විඝටන ප්‍රමාණය ඉතා කුඩා බැවින්, [$NH_4^+(aq)$] = [NHCl(aq)] = x.

$$1.6\times10^{-5}\ mol\ dm^{-3} = \frac{x\ (mol\ dm^{-3})\times1\times10^{-4}\ (mol\ dm^{-3})}{0.1\ mol\ dm^{-3}}$$ (04 + 01)

$x = 1.6\times10^{-2}\ mol\ dm^{-3}$ (04 + 01)

$Mg(OH)_2(s)$ අවක්ෂේප වීම වැලැක්වීම සඳහා අවශ්‍ය

$NH_4Cl$ ප්‍රමාණය $= 1.6\times10^{-2}\ mol\ dm^{-3}\times1.0\ dm^3 = 1.6\times10^{-2}\ mol$ (04 + 01)

5(b)(v) සඳහා ලකුණු 35

(vi) කැටායන විශ්ලේෂණයේ දී $NH_4Cl$ භාවිත කිරීම පැහැදිලි කරන්න.

කාණ්ඩ වෙන් කිරීමේදී III වන කාණ්ඩයේදී $Mg(OH)_2$(හයිඩ්‍රොක්සයිඩ ලෙස අවක්ෂේප විය හැකි අනෙකුත් කැටායන)අවක්ෂේප වීම වැලැක්වීම සඳහා $NH_4OH$ එකතු කිරීමට පෙර $NH_4Cl$ එකතු කරයි. (05)

5(b)(vi) සඳහා ලකුණු 05

| 5 (b) සඳහා මුළු ලකුණු = 100 |
|---|



Visit EDUHUB විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

6. (a) $mM + nN \longrightarrow cC$ ප්‍රතික්‍රියාව සලකන්න.

මෙහි m, n හා c යනු පිළිවෙළින් M, N හා C වල ස්ටොයිකියෝමිතික සංගුණක වේ.

(i) ඉහත ප්‍රතික්‍රියාව මූලික ප්‍රතික්‍රියාවක් බව සලකමින් එහි ශීඝ්‍රතාවය සඳහා ප්‍රකාශනයක් ලියා දක්වන්න. (ප්‍රතික්‍රියාවෙහි ශීඝ්‍රතා නියතය = k වේ.)

ශීඝ්‍රතාව $= k[M]^m[N]^n$ (10)

*6(a)(i) සඳහා ලකුණු 10*

(ii) ප්‍රතික්‍රියාවෙහි පෙළ සෙවීම සඳහා පරීක්ෂණ දෙකක් සිදු කරන ලදී.

පරීක්ෂණය 1: N හි සාන්ද්‍රණය නියතව පවත්වා ගනිමින් හා M හි සාන්ද්‍රණය වෙනස් කරමින් ප්‍රතික්‍රියාවෙහි ආරම්භක ශීඝ්‍රතාවය මනින ලදී.

පරීක්ෂණය 2: M හි සාන්ද්‍රණය 1.0 mol $dm^{-3}$ ලෙස නියතව පවත්වා ගනිමින් හා N හි සාන්ද්‍රණය වෙනස් කරමින් ප්‍රතික්‍රියාවෙහි ආරම්භක ශීඝ්‍රතාවය මනින ලදී.

පරීක්ෂණ දෙකම එකම උෂ්ණත්වයේ දී සිදු කරන ලදී. පරීක්ෂණවල ප්‍රතිඵල පහත ප්‍රස්තාරවල දක්වා ඇත.

පරීක්ෂණය 1 — [N] නියතව තබන ලදී.

පරීක්ෂණය 2 — [M] සාන්ද්‍රණය 1.0 mol $dm^{-3}$ නියතව තබන ලදී.




I. M අනුබද්ධයෙන් ප්‍රතික්‍රියාවෙහි පෙළ සොයන්න.

පළමුවන ප්‍රස්ථාරය අනුව ප්‍රතික්‍රියාවේ ශීඝ්‍රතාව [M] වලින් ස්වායත්ත වේ.

එම නිසා M වලට සාපේක්ෂව ප්‍රතික්‍රියාවේ පෙළ ශුන්‍ය (m = 0) වේ. (10)

එම නිසා, ශීඝ්‍රතාව $= k[N]^n$ (05)

n=0

II. දෙවන ප්‍රස්ථාරය අනුව, N = 0.1 mol $dm^{-3}$ විට ශීඝ්‍රතාව = 10 mol $dm^{-3}$ $s^{-1}$

N = 0.2 mol $dm^{-3}$ විට ශීඝ්‍රතාව = 40 mol $dm^{-3}$ $s^{-1}$

සාන්ද්‍රණය දෙගුණ වන විට ශීඝ්‍රතාවය හතර ගුණයකින් වැඩි වේ. එම නිසා N අනුබද්ධයෙන් පෙළ 2 වේ. (20)

හෝ



විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

ඉහත වගුවේ ලක්ෂ්‍ය දෙකක දත්ත භාවිතයෙන්,

$10\ mol\ dm^{-3}\ s^{-1} = k\ (0.1\ mol\ dm^{-3})^n$ -----------(1) *(04 + 01)*

$40\ mol\ dm^{-3}\ s^{-1} = k\ (0.2\ mol\ dm^{-3})^n$ ------------(2) *(04 + 01)*

$$\frac{(2)}{(1)} \qquad \frac{40\ mol\ dm^{-3}\ s^{-1}}{10\ mol\ dm^{-3}\ s^{-1}} = \left(\frac{0.2\ mol\ dm^{-3}}{0.1\ mol\ dm^{-3}}\right)^n$$ *(04 + 01)*

$4 = 2^n$

$n = 2$ *(05)*

සටහන : තර්කයන් පමණක්, උදා: ප්‍රස්ථාරයේ වක්‍ර හැඩය යනුවෙන් අදහස් වන්නේ n=2 ලෙස ලබාගෙන ඇතිනම් **ලකුණු 10 ක් පමණක්** ප්‍රදානය කරන්න

III. ප්‍රතික්‍රියාවෙහි මුළු පෙළ කුමක් ද?

මුළු පෙළ = n + m = 2 + 0 = 2 *(05)*

IV. ප්‍රතික්‍රියාවෙහි ශීඝ්‍රතා නියතය, k සොයන්න.

(1) වන සමීකරණයෙන්,

$$k = \frac{10\ mol\ dm^{-3}\ s^{-1}}{(0.1\ mol\ dm^{-3})^2}$$ *(04 + 01)*

$= 1000\ mol^{-1}\ dm^3 s^{-1}$ *(04 + 01)*

*6(a)(ii) සඳහා ලකුණු 50*

| 6 (a) සඳහා මුළු ලකුණු = 60 |
|---|



Visit EDUHUB විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

(b) කරාමයකින් සම්බන්ධ කරන ලද P (පරිමාව = V) හා Q (පරිමාව = 2V) යන දෘඪ බඳුන් දෙකක් නියත උෂ්ණත්ව කුටියක පහත දක්වා ඇති පරිදි තබා ඇත.




ආරම්භයේ දී කරාමය වසා ඇත. P තුළ AB වායුව 1.0 mol අඩංගු වන අතර Q හිස්ව ඇත. පද්ධතියේ උෂ්ණත්වය 400 K දක්වා ඉහළ නැංවූ විට AB(g), A(g) හා B(g) බවට පහත දී ඇති සමතුලිත ප්‍රතික්‍රියාවට අනුව වියෝජනය වේ.

$$AB(g) \rightleftharpoons A(g) + B(g)$$

දී ඇති සමතුලිතතාවය සඳහා සමතුලිතතා නියතය $K_c$ වේ. පද්ධතිය සමතුලිතතාවය (පළමු සමතුලිතතාවය) කරා ළඟා වූ විට A(g) ප්‍රමාණය x mol බව සොයා ගන්නා ලදී. කරාමය විවෘත කර පද්ධතිය නැවත සමතුලිතතාවයට (දෙවැනි සමතුලිතතාවය) පත් වීමට ඉඩ හරින ලදී. එවිට පැවතුණ A(g) ප්‍රමාණය y mol බව සොයා ගන්නා ලදී.

(i) $K_c V(1-x) = x^2$ හා $3K_c V(1-y) = y^2$ බව පෙන්වන්න.

| | AB(g) ⇌ | A(g) + | B(g) |
|---|---|---|---|
| t = 0 | 1.0 mol | 0 | 0 |
| සමතුලිත විට | (1-x) mol | x mol | x mol |

(05)

හෝ

සමතුලිත විට සාන්ද්‍රණය $\frac{1-x}{V}$ $\quad \frac{x}{V}$ $\quad \frac{x}{V}$

$$K_C = \frac{\left(x/V\right)\left(x/V\right)}{\left((1-x)/V\right)} = \frac{x^2}{(1-x)V}$$ (05)

$$K_C V(1-x) = x^2$$

කරාමය විවෘත කල විට පරිමාව 3V දක්වා වැඩිවන අතර වියෝජනය වන ප්‍රමාණය y mol වේ.

| | AB(g) ⇌ | A(g) + | B(g) |
|---|---|---|---|
| සමතුලිත විට | (1-y) mol | y mol | y mol |

(05)

හෝ

සමතුලිත විට සාන්ද්‍රණය $\frac{1-y}{3V}$ $\quad \frac{y}{3V}$ $\quad \frac{y}{3V}$

$$K_C = \frac{\left(y/3V\right)\left(y/3V\right)}{\left((1-y)/3V\right)} = \frac{y^2}{(1-y)3V}$$ (05)

$$3K_C V(1-y) = y^2$$

6(b)(i) සඳහා ලකුණු 20

(10)

Visit EDUHUB විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

(i) $y = 0.5$ mol වේ නම්, $x$ හි අගය ගණනය කරන්න.

අවස්ථා දෙකේදී උෂ්ණත්වයේ වෙනසක් නොවන නිසා සමතුලිතතා නියතය $K_c$ එකම අගයක් ගනී. (05)

$$K_c = \frac{x^2}{(1-x)V} = \frac{y^2}{(1-y)3V}$$ (05)

y = 0.5 mol නම්

$$\frac{x^2}{(1-x)V} = \frac{(0.5\,mol)^2}{(1.0\,mol - 0.5\,mol)3V}$$ (05)

$$\frac{x^2}{(1-x)} = \frac{(0.5\,mol)^2}{3(0.5\,mol)} = \frac{0.5\,mol}{3}$$

$$3x^2 - 0.5\,mol(1-x) = 0$$

$$(3x - 1\,mol)(2x + 1\,mol) = 0$$

$x = \frac{1}{3}\,mol$ OR $x = -\frac{1}{2}\,mol$ (පිළිගත නොහැක) (05)

x = 0.33 mol

*6(b)(ii) සඳහා ලකුණු 20*

(ii) ලේ චැටලියර් මූලධර්මය භාවිත කරමින් ඉහත (ii) හි ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න.

පරිමාව V විට, වියෝජනය වන ප්‍රමාණය = 0.33 mol, පරිමාව 3V දක්වා වැඩි කල විට වියෝජනය වන ප්‍රමාණය = 0.5 mol. පරිමාව 3V දක්වා වැඩි කල විට පීඩනය අඩුවන බැවින් එය වලක්වා ගැනීම සඳහා AB(g) වැඩියෙන් වියෝජනය වේ. (10)

*6(b)(iii) සඳහා ලකුණු 10*

(iv) පද්ධතියේ උෂ්ණත්වය 600 K දක්වා වැඩි කරන ලදී. පද්ධතිය සමතුලිතතාවයට (තෙවැනි සමතුලිතතාවය) එළැඹි විට පද්ධතියේ පීඩනය, දෙවැනි සමතුලිතතාවයෙහි පීඩනය මෙන් 1.7 ගුණයක් විය. තෙවැනි සමතුලිතතාවයෙහි දී $A(g)$ ප්‍රමාණය $z$ mol විය. $z$ හි අගය ගණනය කරන්න.

දෙවන සමතුලිතතාවය සඳහා PV=nRT යෙදීමෙන්,

y = 0.5

n = 1 + y = 1.5 mol (04 + 01)



Visit EDUHUB /කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

පරිමාව - 3V, T = 400 K

$$P_2 = 1.5\frac{R \times 400K}{3V}$$

උෂ්ණත්වය 600 K දක්වා වැඩි කිරීමේදී පීඩනය = $P_3 = 1.7\ P_2$ (03)

නොවන සමතුලිතතාවය සඳහා PV=nRT යෙදීමෙන්,

$n = (1+z)\ mol$ (03)

පරිමාව = 3V, T = 600 K

$$P_3 = 1.7\left(1.5\frac{R \times 400K}{3V}\right) = \frac{(1+z)R \times 600K}{3V}$$

$$1 + z = \frac{1.5 \times 400K \times 1.7}{600K} = 1.7$$

$z = 0.7\ mol$

6(b)(iv) සඳහා ලකුණු

(v) AB(g) හි වියෝජනය තාප අවශෝෂක බව පෙන්වන්න.

උෂ්ණත්වය 400 K සිට 600 K දක්වා (පරිමාව නියතව ඇති විට) පත්වන විට වියෝජනය වන ප්‍රමාණය වැඩි වේ. එම නිසා තාපය සපයන විට ඉදිරි ප්‍රතික්‍රියාව වැඩියෙන් සිදුවේ. එබැවින් ඉදිරි ප්‍රතික්‍රියාව තාප අවශෝෂක වේ. (10)

6(b)(v) සඳහා ලකුණු 10

(vi) ඔබගේ ගණනය කිරීම්වල දී භාවිත කරන ලද උපකල්පනය / උපකල්පන සඳහන් කරන්න.

සියලුම වායූන් පරිපූර්ණව හැසිරේ. (05)

6(b)(vi) සඳහා ලකුණු 05

**6 (b) සඳහා මුළු ලකුණු = 90**



Visit EDUHUB / විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

www.AlevelApi.com



(a) ලැයිස්තුවෙහි දී ඇති රසායන ද්‍රව්‍ය පමණක් භාවිත කර ඔබ පහත සඳහන් පරිවර්තනය කරන්නේ කෙසේදැයි පෙන්වන්න.



| රසායන ද්‍රව්‍ය ලැයිස්තුව |
|---|
| $NaBH_4$, $HgSO_4$, තනුක $H_2SO_4$, සාන්ද්‍ර $H_2SO_4$, $PCl_5$, Mg, ether |




(03 x 12 + 04 = 40)

∴ 7 (a) සඳහා මුළු ලකුණු = 40

(b) ආරම්භක කාබනික සංයෝගය ලෙස A පමණක් භාවිත කර B සංයෝගය සංස්ලේෂණය කරන්නේ කෙසේදැයි පෙන්වන්න.






(06 x 10)



විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

පහත දී ඇති විකල්ප පිළිතුරට ද ලකුණු දිය හැක.




(05 x 13)

7 (b) සඳහා මුළු ලකුණු = 60

(c). පහත සඳහන් X සංයෝගය එකිනෙකින් වෙනස් වූ මාර්ග දෙකක් මඟින් සංශ්ලේෂණය කළ හැක. එක් එක් මාර්ගය, නියුක්ලියෝෆිලික ආදේශ ප්‍රතික්‍රියාවක් ලෙස ලිවිය හැක.

$$CH_3-\overset{\overset{\displaystyle OCH_3}{|}}{C}H-CH_3$$

**X**

(i) එක් එක් මාර්ගය සඳහා ප්‍රතික්‍රියක ලියන්න.

$$CH_3-\overset{\overset{\displaystyle Cl}{|}}{C}H-CH_3 \quad + \quad CH_3O^- \qquad (06 + 06)$$

$$CH_3-\overset{\overset{\displaystyle O^-}{|}}{C}H-CH_3 \quad + \quad CH_3Cl \qquad (06 + 06)$$

සටහන : $CH_3O^-$ සඳහා $CH_3OH$ සමඟ Na පිළිගත හැක. 7(c)(i) සඳහා ලකුණු 24



www.alevelapi.com
විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

(ii) ඉහත එක් මාර්ගයක දී, X ට අමතරව, Y නම් වෙනත් සංයෝගයක් ද සෑදේ. මෙම මාර්ගයෙහි යෙදෙන ප්‍රතික්‍රියාව හඳුනාගෙන Y හි ව්‍යුහය ලියන්න.

